SL
EDUCATION
A/L

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023(2024)

සංයුක්ත ගණිතය I
இணைந்த கணிதம் I
Combined Mathematics I

10 S I

## B කොටස

※ ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**11.** (*a*) $x \in \mathbb{R}$ සඳහා $f(x) = ax^2 + bx + c$ යැයි ගනිමු; මෙහි $a > 0$ සහිතව $a, b, c \in \mathbb{R}$ වේ.

$f(x)$ හි අවම අගය $-\dfrac{\Delta}{4a}$ බව පෙන්වන්න; මෙහි $\Delta = b^2 - 4ac$ වේ.

$p$ හා $q$ යනු ධන තාත්ත්වික සංඛ්‍යා යැයි ද $r \in \mathbb{R}$ යැයි ද ගනිමු. තවද, $x \in \mathbb{R}$ සඳහා $g(x) = px^2 + 2\sqrt{pq}\ x + qr$ යැයි ද ගනිමු.

$g(x) = 0$ සමීකරණයට තාත්ත්වික මූල නොමැති බව දී ඇත. $r > 1$ බව පෙන්වන්න.

දැන්, $g(x)$ හි අවම අගය $q$ බව දී ඇත. $r = 2$ බව පෙන්වන්න.

$y = x + 1$ සරල රේඛාව $r = 2$ වන $y = g(x)$ වක්‍රයට $(0, 1)$ ලක්ෂ්‍යයෙහිදී වූ ස්පර්ශ රේඛාව නම්, $p$ හා $q$ හි අගයන් සොයන්න.

(*b*) $a \in \mathbb{R}$ යැයි ද, $p(x)$ යනු මාත්‍රය 4 වූ බහුපදයක් යැයි ද ගනිමු. $(x - a)$ යන්න $p(x)$ හා $p'(x)$ යන දෙකෙහිම සාධකයක් නම්, $(x - a)^2$ යන්න $p(x)$ හි සාධකයක් වන බව පෙන්වන්න; මෙහි $p'(x)$ යනු $p(x)$ හි $x$ විෂයයෙන් ව්‍යුත්පන්නය වේ.

$x \in \mathbb{R}$ සඳහා $f(x) = x^4 - x^3 - 6x^2 + 4x + 8$ යැයි ගනිමු. $(x - 2)^2$ යන්න $f(x)$ හි සාධකයක් බව **අපෝහනය** කරන්න.

$f(-1)$ හි අගය සොයා, $f(x)$ සම්පූර්ණයෙන් සාධකවලට වෙන් කරන්න.

**12.** (*a*) පිරිමි 8 දෙනෙකුගෙන් හා ගැහැනු 6 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමකින් පිරිමි 4 දෙනෙකුගෙන් හා ගැහැනු 4 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් තෝරා ගත යුතුව ඇත.

(i) කමිටුව තෝරා ගත හැකි වෙනස් ආකාර ගණන සොයන්න.

(ii) එබඳු කමිටුවක් තෝරා ගත්තේ යැයි සිතමු. කිසිම ගැහැනුන් දෙදෙනෙකු එකළඟ වාඩි විය නොහැකි නම්, එම කමිටු සාමාජිකයන් පේළියකට වාඩි විය හැකි වෙනස් ආකාර ගණන සොයන්න.



Tharindu Galabure - Combined Maths

(*b*) සියලු $n \in \mathbb{Z}^+$ සඳහා $\sum_{r=1}^{n} U_r = \frac{n}{4}(n+1)(n+2)(n+3)$ බව දී ඇත.

සියලු $n \in \mathbb{Z}^+$ සඳහා $U_n = n(n+1)(n+2)$ බව පෙන්වන්න.

සියලු $r \in \mathbb{Z}^+$ සඳහා $V_r = \frac{1}{U_r}$ යැයි ගනිමු.

සියලු $r \in \mathbb{Z}^+$ සඳහා $V_r = \frac{A}{r(r+1)} + \frac{B}{(r+1)(r+2)}$ වන පරිදි $A$ හා $B$ තාත්ත්වික නියත සොයන්න.

**ඒ නයින් හෝ අන් අයුරකින් හෝ,** $n \in \mathbb{Z}^+$ සඳහා $\sum_{r=1}^{n} V_r = \frac{1}{4} - \frac{1}{2(n+1)(n+2)}$ බව පෙන්වන්න.

$\sum_{r=1}^{\infty} V_r$ අපරිමිත ශ්‍රේණිය අභිසාරී බව තවදුරටත් පෙන්වා එහි ඓක්‍යය සොයන්න.

$\sum_{r=m}^{\infty} V_r = \frac{1}{24}$ වන පරිදි $m \in \mathbb{Z}^+$ සොයන්න.

**13.** (*a*) $a \in \mathbb{R}$ යැයි ද $\mathbf{A} = \begin{pmatrix} 1 & a \\ -a & 1 \end{pmatrix}$ යැයි ද ගනිමු. $\mathbf{A}^{-1}$ පවතින බව පෙන්වා, $\mathbf{A}^{-1}$ ලියා දක්වන්න.

$\mathbf{B} = \begin{pmatrix} 1 & 1 \\ -1 & 1 \end{pmatrix}$ යැයි ගනිමු.

(i) $\mathbf{A}^{-1}\mathbf{B}^{\mathrm{T}} = -\frac{1}{5}\begin{pmatrix} 1 & 3 \\ -3 & 1 \end{pmatrix}$ වන පරිදි වූ $a$ හි අගය සොයන්න.

(ii) $\mathbf{BC} = \begin{pmatrix} 2 & 1 & 3 \\ 0 & -1 & 5 \end{pmatrix}$ වන පරිදි වූ $\mathbf{C}$ න්‍යාසය සොයන්න.

(*b*) $z \in \mathbb{C}$ යැයි ගනිමු. $z$ හි සංකීර්ණ ප්‍රතිබද්ධය $\bar{z}$ හා $z$ හි මාපාංකය $|z|$ අර්ථ දක්වන්න.

$|z| = 1$ නම්, $\bar{z} = \frac{1}{z}$ බව පෙන්වා, ඕනෑම $w \in \mathbb{C}$ සඳහා $|z-w| = |1-\bar{z}w|$ බව **අපෝහනය** කරන්න.

දැන්, $z = \frac{1}{2}(1+\sqrt{3}i)$ යැයි ගනිමු. $|z|$ හා $\operatorname{Arg} z$ සොයන්න.

$|w| < 1$ හා $\operatorname{Arg} w = \alpha$ වන පරිදි $w \in \mathbb{C}$ යැයි ගනිමු; මෙහි $0 < \alpha < \frac{\pi}{3}$ වේ.

එබඳු එක් $w$ සංකීර්ණ සංඛ්‍යාවක් තෝරා ගනිමින්, $1, z, w$ හා $\bar{z}w$ නිරූපණය කරන ලක්ෂ්‍ය ආගන්ඩ් සටහනක ලකුණු කර $|z-w| = |1-\bar{z}w|$ වන්නේ ඇයි දැයි ජ්‍යාමිතිකව පැහැදිලි කරන්න.

(*c*) $n \in \mathbb{Z}^+$ යැයි ගනිමු. $\dfrac{\left(\cos\frac{2\pi}{15} + i\sin\frac{2\pi}{15}\right)^n}{\left(\cos\frac{\pi}{15} + i\sin\frac{\pi}{15}\right)^7}$ හි තාත්ත්වික කොටස $\frac{1}{2}$ වන පරිදි වූ $n$ හි කුඩාතම අගය සොයන්න.

Tharindu Galithure - Combined Maths

**14.** (*a*) $a, p, q \in \mathbb{R}$ හා $p < q$ යැයි ගනිමු.

$x \in \mathbb{R} - \{p, q\}$ සඳහා $f(x) = \dfrac{(ax+1)(x+2)}{(x-p)(x-q)}$ යැයි ගනිමු.

$y = f(x)$ හි ප්‍රස්තාරයේ සිරස් ස්පර්ශෝන්මුඛ $x = 1$ හා $x = -4$ බව දී ඇත. $p$ හා $q$ හි අගයන් ලියා දක්වන්න.

$y = 1$ යන්න $y = f(x)$ හි ප්‍රස්තාරයේ තිරස් ස්පර්ශෝන්මුඛයක් බව දී ඇති විට, $a = 1$ බව පෙන්වන්න.

$a, p$ හා $q$ හි මෙම අගයන් සඳහා $f(x)$ වැඩිවන ප්‍රාන්තර හා $f(x)$ අඩුවන ප්‍රාන්තර සොයන්න.

$g(x) = f(x) + 1$ යැයි ගනිමු.

ස්පර්ශෝන්මුඛ හා හැරුම් ලක්ෂ්‍ය දක්වමින් $y = g(x)$ හි ප්‍රස්තාරයේ දළ සටහනක් අඳින්න.

$g(x)$ හි පරාසය ලියා දක්වන්න.

(*b*) වර්ගඵලය $k$ m$^2$ වූ සෘජුකෝණාස්‍රාකාර පෙදෙසක විකර්ණයක් දිගේ වැටක් සෑදීමට අවශ්‍යව ඇත. සෘජුකෝණාස්‍රයේ දිග $x$ m යැයි ගනිමු (රූපය බලන්න). වැටෙහි දිග $L$ m යන්න $L^2 = x^2 + \dfrac{k^2}{x^2}$ මගින් දෙනු ලබන බව පෙන්වන්න. **ඒ නයින්**, $L$ අවම වන්නේ $x = \sqrt{k}$ වන විට බව පෙන්වන්න.




**15.** (*a*) $k \in \mathbb{R}$ යැයි ගනිමු. $\displaystyle\int \frac{1}{x^2(x-k)}\,dx$ සොයන්න.

(*b*) $\displaystyle\int_1^{e^{\frac{\pi}{2}}} x\sin(\ln x)\,dx$ ට කොටස් වශයෙන් අනුකලනය භාවිතයෙන් හෝ අන් අයුරකින් හෝ

$\displaystyle\int_1^{e^{\frac{\pi}{2}}} x\{2\sin(\ln x) + \cos(\ln x)\}\,dx = e^{\pi}$ බව පෙන්වන්න.

(*c*) $k > 0$ යැයි ගනිමු. $x > 0$ සඳහා $\dfrac{d}{dx}\left\{\left(k\sqrt{x} - 1\right)e^{k\sqrt{x}}\right\} = \dfrac{k^2}{2}e^{k\sqrt{x}}$ බව පෙන්වන්න.

$I_k = \displaystyle\int_1^4 e^{k\sqrt{x}}\,dx$ යැයි ද ගනිමු. $I_k = \dfrac{2}{k^2}\left\{(2k-1)e^{2k} - (k-1)e^{k}\right\}$ බව පෙන්වන්න.

$S$ යනු $y = e^{\sqrt{x}}$, $x = 1$, $x = 4$ හා $y = 0$ වක්‍ර මගින් ආවෘත වන පෙදෙස යැයි ගනිමු.

$S$ හි වර්ගඵලය $2e^2$ බව පෙන්වන්න.

$S$ පෙදෙස $x$-අක්ෂය වටා රේඩියන $2\pi$ වලින් භ්‍රමණය කිරීමෙන් ලැබෙන ඝන වස්තුවේ පරිමාව ද සොයන්න.

Tharindu Gallimbure - Combined Maths

**16.** $m \in \mathbb{R}$ යැයි ද, $l$ යනු $m$ අනුක්‍රමණය ලෙස ඇතිව $A \equiv (3, 1)$ ලක්ෂ්‍ය හරහා යන රේඛාව යැයි ද සිතමු.

$l$ හි සමීකරණය $m$ ඇසුරෙන් ලියා දක්වන්න.

$A$ හරහා $S_1 \equiv 5x^2 + 5y^2 - 10x + 10y + 6 = 0$ වෘත්තයට ස්පර්ශක දෙකක් පවතින බව පෙන්වා, ඒවා අතර සුළු කෝණය සොයන්න.

$B$ හා $D$ යනු මෙම ස්පර්ශක $S_1 = 0$ වෘත්තය ස්පර්ශ කරන ලක්ෂ්‍ය යැයි ද, $C$ යනු $S_1 = 0$ හි කේන්ද්‍රය යැයි ද ගනිමු.

$ABCD$ යනු වෘත්ත චතුරස්‍රයක් බව පෙන්වා $A, B, C$ හා $D$ ලක්ෂ්‍ය හරහා යන වෘත්තයෙහි සමීකරණය සොයන්න.

$BD$ ස්පර්ශ ජ්‍යායෙහි සමීකරණය සොයා, $B$ හා $D$ හරහා යන $S_1 = 0$ වෘත්තය ප්‍රලම්බව ඡේදනය කරන වෘත්තයෙහි සමීකරණය සොයන්න.

**17.** (*a*) $\theta \in \mathbb{R}$ සඳහා $\cos^2\theta + \sin^2\theta = 1$ බව පෙන්වන්න.

$\cos^2 x - 1 = \sin^2 x + 3\cos x$ සමීකරණය තෘප්ත කරන $[0, 2\pi)$ ප්‍රාන්තරය තුළ වූ සියලුම $x$ හි අගයන් සොයන්න.

(*b*) $ABC$ ත්‍රිකෝණයක් යැයි ගනිමු. සුපුරුදු අංකනයෙන් $A + B + C = \pi$ යන ප්‍රතිඵලය භාවිතයෙන්

$\sin\left(\frac{B+C}{2}\right) = \cos\frac{A}{2}$ හා $\cos\left(\frac{B+C}{2}\right) = \sin\frac{A}{2}$ බව පෙන්වන්න.

$\tan\frac{B}{2} + \tan\frac{C}{2} = \cos\frac{A}{2}\sec\frac{B}{2}\sec\frac{C}{2}$ හා $1 - \tan\frac{B}{2}\tan\frac{C}{2} = \sin\frac{A}{2}\sec\frac{B}{2}\sec\frac{C}{2}$ බව **අපෝහනය** කරන්න.

**ඒ නයින්,** $\tan\frac{A}{2}\tan\frac{B}{2} + \tan\frac{B}{2}\tan\frac{C}{2} + \tan\frac{C}{2}\tan\frac{A}{2} = 1$ බව පෙන්වන්න.

(*c*) $x \in \mathbb{R}$ සඳහා $\tan^{-1}(2x) + \tan^{-1}(3x) = \frac{3\pi}{4}$ විසඳන්න.

***

Tharindu Galihure - Combined Maths

# Combined Maths - Marking

# 2023/2024 - ඉංජිනේරු තරිඳු ගලිඹුරේ.

BSc Engineering (Hon's)
University of Moratuwa.
0702519753

## Pure

$$f(x) = ax^2 + bx + c$$

$$f(x) = a\left[x^2 + \frac{b}{a}x + \frac{c}{a}\right]$$

$$= a\left[\left(x + \frac{b}{2a}\right)^2 + \frac{c}{a} - \frac{b^2}{4a^2}\right]$$

$$= a\left[\left(x + \frac{b}{2a}\right)^2 - \frac{b^2 - 4ac}{4a^2}\right]$$

$$f(x) = a\left(x + \frac{b}{2a}\right)^2 - \frac{\Delta}{4a}$$ //

$a > 0$ නිසා, $f(x)$ අවම අගයක් ගනී.

$\therefore$ $f(x)_{min} = \frac{-\Delta}{4a}$ මෙහි $\Delta = b^2 - 4ac$ වේ.

$$g(x) = px^2 + 2\sqrt{pq}\,x + qr = 0$$

තාත්වික මූල නොමැති නිසා $\Delta_x < 0$

$$(2\sqrt{pq})^2 - 4(p)qr < 0$$

$$4pq(1 - r) < 0$$

$p$ හා $q$ ධන තාත්වික සංඛ්‍යා වේ.

$$(1 - r) < 0$$

$$1 < r$$




Tharindu Galimbure - Combined Maths

$$g(x) = px^2 + 2\sqrt{pq}\, x + qr$$

$$= ax^2 + bx + c$$ ආකාරයේ වේ.

$$g(x)_{min} = \frac{-\Delta}{4a}$$

$$= -\frac{4pq(1-r)}{4p}$$

$$g(x)_{min} = q(r-1)$$

$g(x)_{min} = q$ නිසා

$$q = q(r-1)$$

$$1 = r-1$$

$$\underline{\underline{r = 2}}.$$

$r=2$ විට $g(x) = px^2 + 2\sqrt{pq}\, x + 2q$

$p>0$ නිසා $g(x)$ අවම සහිතයි.




Tharindu Galinbure - Combined Maths

$$y = px^2 + 2\sqrt{pq}\,x + 2q$$

x විෂයෙන් වරක් අවකලනය කරමු.

$$\frac{dy}{dx} = 2px + 2\sqrt{pq}$$

(0,1) ලක්ෂ්‍යයේදී අනුක්‍රමණය = 1 [∵ ස්පර්ශකය $y = x+1$ නිසා]

$$\left(\frac{dy}{dx}\right)_{x=0} = 1$$

$$2p(0) + 2\sqrt{pq} = 1$$

$$4pq = 1 \quad \text{—} ①$$

g(x) වක්‍රය (0,1) හරහා යන නිසා

$$1 = p(0) + 2\sqrt{pq}\,(0) + 2q$$

$$q = \frac{1}{2}$$

①න් $\quad p = \frac{1}{2}$

* full Paper සාකච්ඡාව tharindu galinbure Youtube නාලිකාව ඔස්සේ...

Tharindu Galinbure Combined Maths

Date

(b) බෙදීමේ ඇල්ගොරිතමයට අනුව,

$$p(x) = \phi(x)(x-a) + 0$$

$x=a$ $$p(a) = \phi(a)(a-a) + 0$$

$$p(a) = 0 \quad \text{— ①}$$

$$p'(x) = h(x)(x-a) + 0.$$

$x=a$ $$p'(a) = 0 \quad \text{— ②}$$

$p(x)$ යන්න $(x-a)^2$ න් බෙදූවිට ශේෂය $Ax+B$ ලෙස ගනිමු.

$$p(x) = H(x)(x-a)^2 + Ax + B$$

$x=a$ $$p(a) = 0 + Aa + B$$

①න්; $$0 = Aa + B \quad \text{— ⓧ}$$

නැවත වරක් $x$ විෂයෙන් අවකලනයෙන්,

$$p'(x) = H(x)\cdot 2(x-a)(1) + (x-a)^2 H'(x) + A(1)$$

$x=a$ $$p'(a) = 0 + 0 + A$$

②න් $\rightarrow$ $0 = A$ //

ⓧ සමීකරණයට අනුව $0 = 0 + B$

$B = 0$ //

ශේෂය $= Ax + B = 0$ //. ∴ $(x-a)^2$ යන්න $p(x)$ හි සාධකයකි.

(4)

Tharindu Galinbure _Combined Maths

$f(x) = x^4 - x^3 - 6x^2 + 4x + 8$

$x = 2$ විට $f(2) = 2^4 - 2^3 - 6(2)^2 + 4(2) + 8$

$f(2) = 0$

$p(a) = 0$ විට $(x-a)^2$ යන්න $p(x)$ හි සාධකයක් වේ.

එලෙසම $f(2) = 0$ නිසා $(x-2)^2$ යන්න $f(x)$ හි සාධකයක් වේ.

$f(-1) = (-1)^4 - (-1)^3 - 6(-1)^2 + 4(-1) + 8$

$= 1 + 1 - 6 - 4 + 8$

$f(-1) = 0$

$(x+1)$ යන්න $f(x)$ හි සාධකයක් වේ.

$x^4 - x^3 - 6x^2 + 4x + 8 = (x-2)^2(x+1)(Ax+B)$

$x^4$ / $A = 1$

නි/ $B = 2$

$f(x) = (x-2)^2(x+1)(x+2)$

Tharindu Galinbure - Combined Maths

(12) a)

$B - 8 \longrightarrow 4$

$G - 6 \longrightarrow 4$

$\overline{\quad 8 \quad}$

පිරිමි 4 ක් තෝරාගත හැකි ආකාර $= {}^8C_4$

ගැහැණු 4 ක් " " " $= {}^6C_4$

මුළු ආකාර $= {}^8C_4 \times {}^6C_4$

$= \dfrac{8 \times 7 \times 6 \times 5}{4 \times 3 \times 2 \times 1} \times \dfrac{6 \times 5}{2 \times 1}$

$= 70 \times 15$

$= 1050$ //

(ii)

_ B _ B _ B _ B _

ගැහැණු සඳහා ස්ථානයන් තේරිය හැකි ආකාර ගණන $= {}^5C_4 = 5$

පිරිමි වාඩි කරවිය හැකි ආකාර $= 4!$

ගැහැණු " $= 4!$

මුළු ආකාර $= 4! \times 5 \times 4!$

$= 576 \times 5$

$= 2880$



Tharindu Galinbure - Combined Maths

Date | | №

(12) b) මුල් n පදවල එකතුව $S_n = \sum_{r=1}^{n} U_r$

මුල් n-1 පදවල එකතුව $S_{n-1} = \sum_{r=1}^{n-1} U_r$

$$U_n = S_n - S_{n-1}$$

$$U_n = \sum_{r=1}^{n} U_r - \sum_{r=1}^{n-1} U_r$$

$$U_n = \frac{n}{4}(n+1)(n+2)(n+3) - \frac{(n-1)(n)(n+1)(n+2)}{4}$$

$$= \frac{n}{4}(n+1)(n+2)\left[ n+3 - (n-1) \right]$$

$$U_n = n(n+1)(n+2)$$

5 $$V_r = \frac{1}{U_r} = \frac{1}{r(r+1)(r+2)}$$

$=$

$$\frac{1}{r(r+1)(r+2)} = \frac{A}{r(r+1)} + \frac{B}{(r+1)(r+2)}$$

$$1 = A(r+2) + Br$$

$r^0$: $1 = 2A$, $A = \frac{1}{2}$

$r$: $0 = A + B$, $B = -\frac{1}{2}$

Tharindu Gaminbure - Combined Maths

$$\therefore \quad V_r = \frac{1}{2r(r+1)} - \frac{1}{2(r+1)(r+2)} \quad //$$

$f(r) = \dfrac{1}{2r(r+1)}$ ලෙස ගනිමු.

$$V_r = f(r) - f(r+1)$$

$r=1 \qquad V_1 = f(1) - f(2)$

$r=2 \qquad V_2 = f(2) - f(3)$

$r=3 \qquad V_3 = f(3) - f(4)$

$\vdots$

$r=n \qquad V_n = f(n) - f(n+1)$

$(+)$

$$\sum_{r=1}^{n} V_r = f(1) - f(n+1)$$

$$= \frac{1}{2(1)(1+1)} - \frac{1}{2(n+1)(n+2)}$$

$$\sum_{r=1}^{n} V_r = \frac{1}{4} - \frac{1}{2(n+1)(n+2)} \quad //$$

$$\lim_{n\to\infty} \sum_{r=1}^{n} V_r = \lim_{n\to\infty} \frac{1}{4} - \frac{1}{2(n+1)(n+2)}$$

$$\sum_{r=1}^{\infty} V_r = \frac{1}{4} \quad //$$

$n \to \infty$ කල එකතුව පරිමිත නිසා ශ්‍රේණිය අභිසාරී වේ.

ඓක්‍යය $= \dfrac{1}{4}$ //.

Tharindu Galinbure - Combined Maths

$$\sum_{r=1}^{\infty} V_r = \frac{1}{4} \text{ වේ.}$$

$$\sum_{r=1}^{m-1} V_r + \underbrace{\sum_{r=m}^{\infty} V_r}_{\frac{1}{24}} = \frac{1}{4}$$

$$\therefore \sum_{r=1}^{m-1} V_r = \frac{1}{4} - \frac{1}{24} \quad \text{—— ①}$$

$$\sum_{r=1}^{n} V_r = f(1) - f(n+1) \text{ නිසා}$$

$n \rightarrow m-1$ යොදූවි.

$$\sum_{r=1}^{m-1} V_r = \frac{1}{4} - \frac{1}{2m(m+1)} \quad \text{—— ②}$$

① = ②

$$\frac{1}{4} - \frac{1}{24} = \frac{1}{4} - \frac{1}{2m(m+1)}$$

$$m(m+1) = 12$$

$$m^2 + m - 12 = 0$$

$$(m-3)(m+4) = 0$$

$m \in \mathbb{Z}^+$ නිසා $\quad m = 3$.

Tharindu Galinbure - Combined Maths

(13) (a) $A^{-1}$ පවතිමට $|A| \neq 0$ විය යුතුය.

$A = \begin{bmatrix} 1 & a \\ -a & 1 \end{bmatrix}$ නම් $|A| = 1(1) - (a)(-a)$

$|A| = 1 + a^2$




a හි සියලු තාත්වික අගයකට $a^2+1$ ශුන්‍ය ලබා නොදේ.

∴ සියලු $a \in \mathbb{R}$ සඳහා $|A| \neq 0$ වේ.

∴ $A^{-1}$ පවතී.

$$A^{-1} = \frac{\begin{bmatrix} 1 & -a \\ a & 1 \end{bmatrix}}{1+a^2}$$ //

(i) $$A^{-1}B^{T} = -\frac{1}{5}\begin{bmatrix} 1 & 3 \\ -3 & 1 \end{bmatrix}$$

$$\frac{\begin{bmatrix} 1 & -a \\ a & 1 \end{bmatrix}}{a^2+1} \times \begin{bmatrix} 1 & -1 \\ 1 & 1 \end{bmatrix} = -\frac{1}{5}\begin{bmatrix} 1 & 3 \\ -3 & 1 \end{bmatrix}$$

$$\frac{1}{a^2+1}\begin{bmatrix} 1-a & -1-a \\ a+1 & -a+1 \end{bmatrix} = -\frac{1}{5}\begin{bmatrix} 1 & 3 \\ -3 & 1 \end{bmatrix}$$

එම එකක අවයව සැසඳීමෙන් ( සමාන කිරීමෙන්)

$$\frac{1-a}{a^2+1} = -\frac{1}{5} \qquad\qquad \frac{-1-a}{a^2+1} = \frac{-3}{5}$$

$5 - 5a = -a^2 - 1$

$a^2 - 5a + 6 = 0$ $\qquad\qquad 3a^2 - 5a - 2 = 0$

$(a-3)(a-2) = 0$ $\qquad\qquad (3a-1)(a-2) = 0$

$a = 3$ // $\quad$ $a = 2$ $\qquad\qquad a = \frac{1}{3}$ හෝ $a = 2$

(10) අවස්ථා දෙකම සත්‍ය වීමට $a = 2$ විය යුතුයි.

(ii)

$$BC = \begin{bmatrix} 2 & 1 & 3 \\ 0 & -1 & 5 \end{bmatrix}$$

$$\underbrace{B^{-1}B}_{I}C = B^{-1}\begin{bmatrix} 2 & 1 & 3 \\ 0 & -1 & 5 \end{bmatrix}$$

$$C = \frac{\begin{bmatrix} 1 & -1 \\ 1 & 1 \end{bmatrix}}{2}\begin{bmatrix} 2 & 1 & 3 \\ 0 & -1 & 5 \end{bmatrix}$$

$$C = \frac{1}{2}\begin{bmatrix} 2 & 2 & -2 \\ 2 & 0 & 8 \end{bmatrix}$$

$$C = \begin{bmatrix} 1 & 1 & -1 \\ 1 & 0 & 4 \end{bmatrix}_{2\times 3}$$

(b) සංකීර්ණ සංඛ්‍යා දෙකක එකතුව හා ගුණිතය තාත්වික නම් ඒවා එකිනෙක ප්‍රතිබද්ධ සංකීර්ණ සංඛ්‍යා වේ.

$z = x + iy$ $x, y \in \mathbb{R}$ නම්

එවිට $\bar{z} = x - iy$ වේ. ($\bar{z}$ යනු $z$ හි ප්‍රතිබද්ධය වේ)

$|z|$ යනු $z$ හි විශාලත්වය වේ.

$$|z| = \sqrt{x^2 + y^2}$$

Tharindu Galinbure - Combined Maths

$$z\cdot\bar{z} = (x+iy)(x-iy)$$
$$= x^2+y^2 = |z|^2$$

$$z\cdot\bar{z} = 1 \quad (\,|z| = 1 \text{ නිසා})$$
$$\bar{z} = \frac{1}{z} \text{ වේ.}$$

$$|z-w| = \left|\frac{1}{\bar{z}} - w\right| = \frac{|1-\bar{z}w|}{\underbrace{|\bar{z}|}_{1}}$$

$$|z-w| = |1-\bar{z}w| \text{ වේ.}$$

$$z = \frac{1}{2} + i\frac{\sqrt{3}}{2} = \cos\pi/3 + i\sin\pi/3 \text{ වේ.}$$

$$|z| = 1 \text{ හා } Arg(z) = \pi/3$$




$1 \to A$
$z \to B$
$w \to C$
$w\bar{z} \to D$

$OA = OZ = 1$
$B\hat{O}C = A\hat{O}D = \pi/3 - \alpha$

$OC = OD$
$[\; |w| = |w\bar{z}| \text{ වන නිසා}]$

$\therefore$ OBC $\Delta$ හා OAD $\Delta$ අංගසම වේ.
[ පා.කෝ.පා අවස්ථාව ]

එවිට BC = AD වේ. [ අංගසම $\Delta$වල අනුරූප අංග ]

$|z-w| = |1-w\bar{z}|$

(12)

Tharindu Galinbure - Combined Maths

(c) $$\frac{\left(\cos\frac{2\pi}{15} + i\sin\frac{2\pi}{15}\right)^n}{\left(\cos\frac{\pi}{15} + i\sin\frac{\pi}{15}\right)^7} = \frac{\left(\cos\frac{2n\pi}{15} + i\sin\frac{2n\pi}{15}\right)}{\cos\frac{7\pi}{15} + i\sin\frac{7\pi}{15}}$$

$$= \cos\left(\frac{2\pi n}{15} - \frac{7\pi}{15}\right) + i\sin\left(\frac{2n\pi}{15} - \frac{7\pi}{12}\right)$$

$$= \cos(2n-7)\frac{\pi}{15} + i\sin(2n-7)\frac{\pi}{15} \quad //$$

තාත්වික කොටස $= \cos(2n-7)\frac{\pi}{15} = \frac{1}{2}$

$$\cos(2n-7)\frac{\pi}{15} = \cos\pi/3$$

$$(2n-7)\frac{\pi}{15} = 2n'\pi \pm \frac{\pi}{3}$$

$$2n-7 = 30n' \pm 5$$

(+)

$2n-7 = 30n'+5$

$2n = 30n'+12$

$n = 15n'+6$

$n'=0$ විට $n=6$

$n'=1$ විට $n=21$

(−)

$2n = 30n'+2$

$n = 15n'+1$

$n'=0$ විට $n=1$ ✓

$n'=1$ විට $n=16$

⋮

ඒ අනුව $n$ හි කුඩාතම අගය $n=1$ වේ.

Tharindu Galinbure - Combined Maths

(14) $x = 1$ හා $x = -4$ සිරස් ස්පර්ශෝන්මුඛ නිසා

Case I $\quad p = 1$ හා $q = -4$

Case II $\quad p = -4$ හා $q = 1$ විය හැක.

නමුත් $q > p$ නිසා $p = -4$ හා $q = 1$ වේ.

$$\lim_{x \to \pm\infty} \frac{(ax+1)(x+2)}{(x+4)(x-1)} = 1$$

$$\lim_{x \to \pm\infty} \frac{\left(a + \frac{1}{x}\right)\left(1 + \frac{2}{x}\right)}{\left(1 + \frac{4}{x}\right)\left(1 - \frac{1}{x}\right)} = 1$$

$\left(\frac{1}{\infty} = 0\right)$

$$\frac{a \times 1}{1} = 1$$

$$\underline{\underline{a = 1}}$$

$$f(x) = \frac{(x+1)(x+2)}{(x+4)(x-1)} \qquad (x \neq -4, 1)$$

$$f'(x) = \frac{(x+4)(x-1)[x+1+x+2] - (x+1)(x+2)[x+4+x-1]}{(x+4)^2(x-1)^2}$$

$$= \frac{(x+4)(x-1)(2x+3) - (x+1)(x+2)(2x+3)}{(x+4)^2(x-1)^2}$$

$$f'(x) = \frac{(2x+3)[-6]}{(x+4)^2(x-1)^2}$$

$f'(x) = 0$ වන්නේ $\underline{x = -\frac{3}{2}}$

Tharindu Galabure - Combined Maths

$$f(x) = \frac{(x+1)(x+2)}{(x+4)(x-1)} \qquad f'(x) = \frac{-6(2x+3)}{(x+4)^2(x-1)^2}$$

$x = -\frac{3}{2}$ වට $\qquad f\left(-\frac{3}{2}\right) = \frac{1}{25}$ //.

| | $-\infty < x < -4$ | $-4 < x < -\frac{3}{2}$ | $-\frac{3}{2} < x < 1$ | $1 < x < \infty$ |
|---|---|---|---|---|
| $f'(x)$ ලකුණ | $\frac{(-)(-)}{(+)}$ $(+)$ | $\frac{(-)(-)}{(+)} = (+)$ | $\frac{(-)(+)}{(+)} = (-)$ | $\frac{(-)(+)}{(+)} = (-)$ |
| $f(x)$ | වැඩිවේ | වැඩිවේ | අඩුවේ | අඩුවේ. |

($x=-4$, $x=-\frac{3}{2}$, $x=1$)

$\left(-\frac{3}{2}, \frac{1}{25}\right)$ උපරිමයකි.

$f(0) = \frac{1}{2}$

$g(x) = f(x) + 1$ ලෙසලු.

$g(x)$ හි හැරුම් ලක්ෂ්‍යය $= \left(-\frac{3}{2}, \frac{1}{25}+1\right)$

$= \left(-\frac{3}{2}, \frac{26}{25}\right)$

$g(x)$ හි තිරස් ස්පර්ශෝන්මුඛය $y = 1+1$

$y = 2$ වේ.




$g(x)$ හි පරාසය

$\left(-\infty, \frac{26}{25}\right] \cup (2, \infty)$



Tharindu Galinbure - Combined Maths

(b)




වර්ගඵලය

$$K = x \times \sqrt{L^2 - x^2}$$

$$K^2 = x^2 (L^2 - x^2)$$

$$L^2 = x^2 + \frac{K^2}{x^2}$$

$$L = \frac{\sqrt{x^4 + K^2}}{x}$$

L සඳහා x විචලනය අධ්‍යයනය කරමු.

$$\frac{dL}{dx} = \frac{x \times \frac{1}{2\sqrt{x^4 + K^2}} \times 4x^3 - \sqrt{x^4 + K^2}}{x^2}$$

$$= \frac{2x^4 - x^4 - K^2}{x^2 \sqrt{x^4 + K^2}}$$

$$= \frac{x^4 - K^2}{x^2 \sqrt{x^4 + K^2}}$$

$$\frac{dL}{dx} = \frac{(x - \sqrt{K})(x + \sqrt{K})(x^2 + K^2)}{x^2 (\sqrt{x^4 + K^2})}$$

$\frac{dL}{dx} = 0$; $x = \sqrt{K}$ ($x > 0$ නිසා)




$x = \sqrt{K}$ විට L අවම වේ.



Tharindu Galinbure - Combined Maths

(15) (a)

$$\frac{1}{x^2(x-k)} = \frac{A}{x} + \frac{B}{x^2} + \frac{C}{x-k}$$

$$1 = A(x)(x-k) + B(x-k) + C(x^2)$$

$x^0$: $1 = B(-k)$, $B = \frac{-1}{k}$ //

$x$: $0 = -Ak + B$, $A = \frac{-1}{k^2}$ //

$x^2$:

$0 = A + C$

$\therefore \quad C = \frac{1}{k^2}$

$$\frac{1}{x^2(x-k)} = \frac{-1}{k^2(x)} - \frac{1}{k(x^2)} + \frac{1}{k^2(x-k)}$$

$$\int \frac{1}{x^2(x-k)}\,dx = \frac{-1}{k^2}\int \frac{1}{x}\,dx - \frac{1}{k}\int \frac{1}{x^2}\,dx + \frac{1}{k^2}\int \frac{1}{x-k}\,dx$$

$$= \frac{-1}{k^2}\ln|x| + \frac{1}{kx} + \frac{1}{k^2}\ln|x-k| + C$$

C – ස්ථිර නියතයකි.

(b)

$$I = \int_1^{e^{\pi/2}} x\sin(\ln x)\,dx = \int_1^{e^{\pi/2}} \sin(\ln x)\,\frac{d}{dx}\left(\frac{x^2}{2}\right).dx$$

$$I = \left[\sin(\ln x)\cdot\frac{x^2}{2}\right]_1^{e^{\pi/2}} - \int_1^{e^{\pi/2}} \frac{x^2}{2}\times\cos(\ln x)\times\frac{1}{x}\,dx$$

$$I = \left(\underbrace{\sin\left[\ln e^{\pi/2}\right]}_{1}\cdot\frac{e^{\pi}}{2}\right) - (0) - \frac{1}{2}\int_1^{e^{\pi/2}} x\cos(\ln x)\,dx$$

$\left(\ln e^{\pi/2} = \frac{\pi}{2}\right)$

$$I = \frac{e^{\pi}}{2} - \frac{1}{2}J$$ ලෙස ගනිමු.



Tharindu Galinbure - Combined Maths

මෙහි $J = \int_1^{e^{\pi/2}} x\cos(\ln x)\,dx$ වේ.

Date

$$2I = \frac{e^{\pi}}{2} - \frac{J}{2}$$

$$2I + J = e^{\pi}$$

$$\int_1^{e^{\pi/2}} 2x\sin(\ln x)\,dx + \int_1^{e^{\pi/2}} x\cos(\ln x)\,dx = e^{\pi}$$

$$\int_1^{e^{\pi/2}} x\left[2\sin(\ln x) + \cos(\ln x)\right]dx = e^{\pi}$$

(c) $$\frac{d}{dx}\Big[\underbrace{(k\sqrt{x}-1)e^{k\sqrt{x}}}_{y}\Big]$$

$$y = (k\sqrt{x}-1)e^{k\sqrt{x}}$$

$$\frac{dy}{dx} = (k\sqrt{x}-1)\cdot e^{k\sqrt{x}} \times k \times \frac{1}{2\sqrt{x}} + e^{k\sqrt{x}}\left(\frac{k}{2\sqrt{x}}\right)$$

$$= e^{k\sqrt{x}}\left[\frac{(k\sqrt{x}-1)k}{2\sqrt{x}} + \frac{k}{2\sqrt{x}}\right)$$

$$\frac{dy}{dx} = \frac{ke^{k\sqrt{x}}}{2\sqrt{x}}\left[k\sqrt{x} - 1 + 1\right]$$

$$\frac{d}{dx}\left((k\sqrt{x}-1)e^{k\sqrt{x}}\right) = \frac{k^2}{2}e^{k\sqrt{x}}$$ //

Tharindu Gamburge Combined Maths

$$I_k = \int_1^4 e^{k\sqrt{x}}\,dx$$

$$\int_1^4 \frac{d}{dx}\left((k(\sqrt{x}-1)e^{k\sqrt{x}}\right)dx = \frac{k^2}{2}\int_1^4 e^{k\sqrt{x}}\,dx$$

$$\left[(k\sqrt{x}-1)e^{k\sqrt{x}}\right]_1^4 = \frac{k^2}{2}\int_1^4 e^{k\sqrt{x}}\,dx$$

$$(k\sqrt{4}-1)e^{k\sqrt{4}} - (k\sqrt{1}-1)e^{k\sqrt{1}} = \frac{k^2}{2}\int_1^4 e^{k\sqrt{x}}\,dx$$

$$\frac{2}{k^2}\left((2k-1)e^{2k} - (k-1)e^{k}\right) = \int_1^4 e^{k\sqrt{x}}\,dx$$

වර්ගඵලය $A = \int_1^4 e^{\sqrt{x}}\,dx$

$k = 1$ විට $A = \int_1^4 e^{\sqrt{x}}$

$$= \frac{2}{(1)^2}\left[(2-1)e^2 - 0\right]$$

$$A = 2e^2$$

පරිමාව; $V = \int_1^4 \pi\left(e^{\sqrt{x}}\right)^2 dx = \pi\int_1^4 e^{2\sqrt{x}}\,dx$

$k = 2$ විට; $V = \pi\left\{\frac{2}{2^2}\left[(3)e^4 - (1)e^2\right]\right\}$

$$= \pi\left[\frac{3}{2}e^4 - \frac{e^2}{2}\right] = \frac{\pi e^2}{2}(3e^2-1)$$

Tharindu Galinbure - Combined Maths

(16)

$y - 1 = m(x-3)$

රේඛාව → $mx - y + 1 - 3m = 0$

වෘත්තයේ කේන්ද්‍රය $= (1,-1)$

$S_1 \Rightarrow \left[5x^2+5y^2-10x+10y+6\right]_{(3,1)}$

$45+5-30+10+6 > 0$

$\therefore$ (3,1) ලක්ෂ්‍යය වෘත්තයට පිටතින් පිහිටයි.

$\therefore$ (3,1) හරහා ලක්ෂ්‍යයේ සිට වෘත්තයට ස්පර්ශක දෙකක් ඇඳිය හැකිය.




රේඛාව → $mx - y + 1 - 3m = 0$ වේ.

ස්පර්ශකයක් නිසා

$d = r$

$$\frac{|m(1) - (-1) + 1 - 3m|}{\sqrt{m^2+(-1)^2}} = \frac{2}{\sqrt{5}}$$

අරය $= \sqrt{1^2+(-1)^2-\frac{6}{5}}$

$r = \frac{2}{\sqrt{5}}$

$$\frac{|1-m|}{\sqrt{1+m^2}} = \frac{1}{\sqrt{5}}$$

$5(1-m)^2 = 1+m^2$

$4m^2 - 10m + 4 = 0 \qquad 2m^2-5m+2=0$

$(2m-1)(m-2) = 0$

$m = \frac{1}{2}$ හෝ $m = 2$

Tharindu Gallinbure - Combined Maths




$$\tan\theta = \left|\frac{m_1 - m_2}{1 + m_1 m_2}\right|$$

$$\tan\theta = \left|\frac{2 - \frac{1}{2}}{1 + 1}\right|$$

$$\tan\theta = \frac{3}{4}$$

$$\theta = \tan^{-1}\left(\frac{3}{4}\right)$$




$A\hat{B}C$ හා $A\hat{D}C$

සම්මුඛ කෝණ වල එකතුව 180° වේ.

∴ ABCD වෘත්ත චතුරස්‍රයක් වේ

ABCD හරහා යන වෘත්තයේ

AC යනු විෂ්කම්භයයි. වේ.

∴ වෘත්තයේ සමීකරණය

$$(x-3)(x-1) + (y-1)(y+1) = 0$$

$$x^2 + y^2 - 4x + 2 = 0$$

A අනුබද්ධයෙන් BD ස්පර්ශ ජ්‍යායේ සමීකරණය

$$xx_0 + yy_0 + g(x + x_0) + f(y + y_0) + c = 0$$

$$x(3) + y(1) - (x+3) + (y+1) + \frac{6}{5} = 0$$

$$2x + 2y - 4/5 = 0$$

$$5x + 5y - 2 = 0$$

Tharindu Galinbure Combined Maths

$S_1 = x^2 + y^2 - 2x + 2y + \frac{6}{5} = 0$

Date ____ | ____ | ____    №____

$5x + 5y - 2 = 0$ හා $S_1 = 0$ හරහා යන සාමාන්‍ය වෘත්තය

$$S_1 + \lambda l = 0$$

$$x^2 + y^2 - 2x + 2y + \frac{6}{5} + \lambda(5x + 5y - 2) = 0$$

$$S = x^2 + y^2 + (5\lambda - 2)x + (5\lambda + 2)y + \frac{6}{5} - 2\lambda = 0$$

$S = 0$ හා $S_1 = 0$ වෘත්ත ප්‍රලම්බව ඡේදනය වන නිසා

$$2(-1)\left(\frac{5\lambda - 2}{2}\right) + 2(1)\left(\frac{5\lambda + 2}{2}\right) = \frac{6}{5} + \frac{6}{5} - 2\lambda$$

$$2 - 5\lambda + 5\lambda + 2 = \frac{12}{5} - 2\lambda$$

$$2\lambda = \frac{-8}{5}$$

$$\lambda = -4/5 \qquad (5\lambda = -4)$$

$$S = x^2 + y^2 - 6x - 2y + \frac{14}{5} = 0$$

$$S = 5x^2 + 5y^2 - 30x - 10y + 14 = 0$$

Tharindu Galinbure - Combined Maths

(17) a) $\cos^2\theta + \sin^2\theta = 1$




$\sin\theta = \dfrac{AD}{AC}$  $\cos\theta = \dfrac{DC}{AC}$

පයිතගරස් ප්‍රමේයයෙන්,

$AD^2 + DC^2 = AC^2$

$\dfrac{AD^2}{AC^2} + \dfrac{DC^2}{AC^2} = 1$

$(\sin\theta)^2 + (\cos\theta)^2 = 1$

$\sin^2\theta + \cos^2\theta = 1 \quad (\forall\, \theta \in \mathbb{R})$

$\cos^2 x - 1 = \sin^2 x + 3\cos x$

$\cos^2 x - 1 = 1 - \cos^2 x + 3\cos x$

$2\cos^2 x - 3\cos x - 2 = 0$

$(2\cos x + 1)(\cos x - 2) = 0$

$2\cos x + 1 = 0$ හෝ $\cos x - 2 = 0$

$\cos x = -\frac{1}{2}$  $\cos x = 2$

විය නොහැක $[-1 \leq \cos x \leq 1]$

$\cos x = \cos 2\pi/3$

$x = 2n\pi \pm 2\pi/3$

$(n \in \mathbb{Z})$

$n = 0 \quad x = 2\pi/3$ //

$n = 1 \quad x = 2\pi - 2\pi/3 = 4\pi/3$ //

Tharindu Gallabure - Combined Maths

(b)

$$B + C = \pi - A$$

$$\frac{B+C}{2} = \frac{\pi}{2} - A/2$$

$$\sin\left(\frac{B+C}{2}\right) = \sin\left(\frac{\pi}{2} - \frac{A}{2}\right) = \cos A/2 \,//$$

$$\cos\left(\frac{B+C}{2}\right) = \cos\left(\frac{\pi}{2} - \frac{A}{2}\right) = \sin A/2 \,//$$

$$\sin\left(\frac{B}{2} + \frac{C}{2}\right) = \cos A/2$$

$$\sin\frac{B}{2}\cos\frac{C}{2} + \cos\frac{B}{2}\sin\frac{C}{2} = \cos A/2$$

$\cos\frac{C}{2}\cos\frac{B}{2}$ වලින් බෙදුම.

$$\tan\frac{B}{2} + \tan\frac{C}{2} = \frac{\cos A/2}{\cos B/2 \cos C/2}$$

$$\tan\frac{B}{2} + \tan C/2 = \cos A/2 \sec\frac{B}{2} \cdot \sec C/2 \quad \text{—(1)}$$

$$\cos\left(\frac{B+C}{2}\right) = \sin A/2$$

$$\cos B/2 \cos\frac{C}{2} - \sin\frac{B}{2}\sin C/2 = \sin A/2$$

$\div \cos\frac{B}{2}\cos C/2$

$$1 - \tan B/2 \tan C/2 = \sin A/2 \cdot \sec B/2 \sec C/2 \quad \text{—(2)}$$

$\frac{(1)}{(2)}$

$$\frac{\tan B/2 + \tan C/2}{1 - \tan\frac{B}{2}\tan C/2} = \cot A/2$$

Tharindu Galinbure - Combined Maths

$$\tan\frac{B}{2} + \tan C/_2 = \frac{1}{\tan A/_2}\left[1 - \tan B/_2 \tan C/_2\right]$$

$$\tan\frac{A}{2}\tan\frac{B}{2} + \tan C/_2 \tan A/_2 = 1 - \tan\frac{B}{2}\tan C/_2$$

$$\tan\frac{A}{2}\tan\frac{B}{2} + \tan\frac{B}{2}\tan C/_2 + \tan\frac{C}{2}\tan A/_2 = 1$$

(c) $\underbrace{\tan^{-1}(2x)}_{\alpha} + \underbrace{\tan^{-1}(3x)}_{\beta} = \frac{3\pi}{4}$

$\tan\alpha = 2x \qquad \tan\beta = 3x$

$$\alpha + \beta = \frac{3\pi}{4}$$

$$\tan(\alpha+\beta) = \tan 3\pi/4$$

$$\frac{\tan\alpha + \tan\beta}{1 - \tan\alpha\tan\beta} = -1$$

$$2x + 3x = -(1 - 2x \cdot 3x)$$

$$5x = -1 + 6x^2$$

$$-6x^2 + 5x + 1 = 0$$

$$6x^2 - 5x - 1 = 0$$

$$(6x+1)(x-1) = 0$$

$$x = 1 \qquad x = -1/6$$

$x = -1/6$ විට

$L.H.S = \tan^{-1}\left(-\frac{1}{3}\right) + \tan^{-1}\left(-\frac{1}{2}\right) < 0$ වේ. එය විය නොහැකිය.

$\therefore x = 1$

Tharindu Galinbure - Combined Maths

6775



සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023(2024)

| | |
|---|---|
| සංයුක්ත ගණිතය | II |
| இணைந்த கணிதம் | II |
| Combined Mathematics | II |

10 S II

## B කොටස

※ ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

(මෙම ප්‍රශ්න පත්‍රයෙහි $g$ මගින් ගුරුත්වජ ත්වරණය දැක්වෙයි.)

**11.** (*a*) එකිනෙක අතර දුර 1750 m වූ $P$ හා $Q$ දුම්රිය ස්ථාන දෙකක් අතර දිවෙන $R_1$ හා $R_2$ යනු සෘජු සමාන්තර දුම්රිය මාර්ග දෙකකි. $t = 0$ හිදී $P$ දුම්රිය ස්ථානයෙන් නිශ්චලතාවයෙන් ආරම්භ කරන $A$ දුම්රියක් $10 \text{ m s}^{-2}$ ක ඒකාකාර ත්වරණයකින් $R_1$ දුම්රිය මාර්ගය දිගේ තත්පර $T$ කාලයක් ගමන් කර, $t = T$ s හිදී එය ලබාගන්නා වේගය තත්පර 30 ක කාලයක් පවත්වා ගනී. ඉන්පසුව, එය තත්පර $T$ කාලයක් ඒකාකාරව මන්දනය වී $Q$ දුම්රිය ස්ථානයේදී නිශ්චලතාවයට පැමිණේ. $P$ සිට $Q$ දක්වා $A$ දුම්රියේ චලිතය සඳහා ප්‍රවේග-කාල ප්‍රස්තාරයේ දළ සටහනක් ඇඳ ගමනට ගතවූ මුළු කාලය 40 s බව පෙන්වන්න.




$\overrightarrow{PQ}$ දිශාවට $40 \text{ m s}^{-1}$ ක නියත වේගයකින් $R_2$ දුම්රිය මාර්ගය දිගේ ගමන් කරන තවත් $B$ දුම්රියක් $t = 0$ හිදී $P$ දුම්රිය ස්ථානය පසු කරයි. $t = 0$ සිට $t = 40$ s දක්වා $B$ දුම්රියට සාපේක්ෂව $A$ දුම්රියේ චලිතය සඳහා ප්‍රවේග-කාල ප්‍රස්තාරයේ දළ සටහනක් අඳින්න.

(*b*) සෘජු සමාන්තර ඉවුරු දෙකක් අතරින්, $d$ m පළල ගඟක් $u \text{ m s}^{-1}$ ඒකාකාර වේගයකින් ගලා බසී. ජලයට සාපේක්ෂව $\sqrt{2}u \text{ m s}^{-1}$ වේගයක් ඇති $P$ නම් පිහිනුම්කරුවෙක් එක් ඉවුරක වූ $A$ ලක්ෂ්‍යයකින් ආරම්භ කර, අනිත් ඉවුරේ $A$ ට කෙළින්ම ප්‍රතිවිරුද්ධව ඇති $B$ ලක්ෂ්‍යයට ළඟා වීමට පිහිනයි. $P$ පිහිනුම්කරු ට $B$ කරා ළඟා වීමට ගතවන කාලය $\dfrac{d}{u}$ s බව පෙන්වන්න.




